# ශ්‍රී ලංකා ස්වේච්ඡා සේවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

## 1. හැඳින්වීම සහ පූර්විකාව

ශ්‍රී ලංකා රජය, රටේ සමාජ-ආර්ථික සංවර්ධනය, මහජන සුභසාධනය සහ පාරිසරික සංරක්ෂණ ක්‍රියාවලිය සඳහා පුරවැසියන්ගේ ස්වකැමැත්තෙන් සිදුවන සක්‍රීය සහභාගීත්වය ඉහළ නැංවීම සහ එය විධිමත් කිරීම වෙනුවෙන් කැපවී සිටී.

ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා සේවය යනු හුදු නවීන සංකල්පයක් නොව, අපගේ සංස්කෘතික උරුමය, සාමූහිකත්වය සහ ආගමික සාරධර්ම සමඟ බැඳුණු, "ශ්‍රමදානය" සහ "පරාර්ථකාමීත්වය" වැනි දේශීය සිරිත් විරිත් තුළින් පෝෂණය වූ අගනා ක්‍රියාවලියකි. රටක තිරසාර සමාජ-ආර්ථික සංවර්ධනය, මහජන සුභසාධනය සහ පාරිසරික සංරක්ෂණ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා පුරවැසියන්ගේ ස්වේච්ඡා දායකත්වය අතිශයින් වැදගත් වේ.

වර්තමාන ගෝලීය සන්දර්භය තුළ සහ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සපුරා ගැනීම උදෙසා, මෙම ස්වේච්ඡා ශ්‍රමය හා කුසලතා වඩාත් විධිමත්, ක්‍රමානුකූල සහ ඵලදායී ලෙස ජාතික සංවර්ධන ක්‍රියාවලියට දායක කර ගැනීම රජයේ මූලික අපේක්ෂාවකි.

මෙතෙක් ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා සංවිධාන නියාමනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා මූලික වශයෙන් භාවිත වූයේ 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනතයි. මෙම පනත මඟින් ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය මට්ටමින් නියාමනය කිරීම සඳහා ශක්තිමත් නීතිමය පදනමක් සැපයූ අතර, එය මෙරට ස්වේච්ඡා ක්ෂේත්‍රයේ ප්‍රගතිය උදෙසා ලැබුණු වැදගත් නෛතික දායකත්වයකි.

21 වන සියවසේ නැගී එන සමාජ-ආර්ථික අභියෝග, ආපදා කළමනාකරණය සහ තරුණ ප්‍රජාව සතු සක්‍රීය විභවතා වඩාත් සාර්ථකව කළමනාකරණය කරනු පිණිස, 2019.07.19 දිනැති අංක 19/2059/132/023 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, අනුමත කරන ලද ස්වේච්ඡා කටයුතු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය තවදුරටත් ශක්තිමත් කරමින් අවශ්‍ය සංශෝධන ඇතුළත් කිරීම අත්‍යවශ්‍ය කරුණක් වී ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ස්වේච්ඡා සේවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, පවතින නීතිමය ප්‍රතිපාදන සහ නවීන අවශ්‍යතා එකිනෙක යා කරමින් ස්වේච්ඡා සේවය ජාතික මට්ටමින් ප්‍රවර්ධනය කිරීමටත්, ස්වේච්ඡා සේවකයන්ගේ අයිතිවාසිකම් හා ආරක්ෂාව තහවුරු කිරීමටත් ගතහැකි සුවිශේෂී ඉදිරි පියවරකි.

මෙම ජාතික ප්‍රතිපත්තිය පහත සඳහන් මූලික ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ මත පදනම් වේ:

- ස්වේච්ඡා ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී අවම පිරිවැයක් සහ උපරිම කාර්යක්ෂමතාවයක් සහතික කිරීම.
- ප්‍රජාවගේ සහ රටේ අභිවෘද්ධිය සඳහා අදාළ සියලුම රාජ්‍ය, පෞද්ගලික සහ සිවිල් සංවිධාන සමඟ ස්වේච්ඡා කණ්ඩායම් සම්බන්ධීකරණය කිරීම.
- ස්වේච්ඡා සේවය ජාතික මට්ටමින් පිළිගැනීම, දිරිගැන්වීම සහ නිසි ඇගයීමට ලක් කිරීම.
- ස්වේච්ඡා සේවකයන්ගේ සෞඛ්‍ය, ජීවිත සහ වෘත්තීය ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය ප්‍රමිති සහ ගුණාත්මක තත්ත්ව සහතික කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
- ස්වේච්ඡා සේවකයන් සේවයේ යෙදෙන ආයතනික යාන්ත්‍රණ සහ යටිතල පහසුකම් ඵලදායී ලෙස ඩිජිටල්කරණය හා නවීකරණය කිරීම.

## 2. ප්‍රතිපත්තියේ දැක්ම සහ මෙහෙවර

### දැක්ම

"ස්වේච්ඡා සේවය තුළින් පොදු ජනතාවගේ යහපැවැත්ම හා තිරසාර සමාජ-ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කරන උදාර සමාජයක් ගොඩනැගීම."

### මෙහෙවර

"ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා සේවය ව්‍යුහාත්මකව ශක්තිමත් කර, කිසිදු මූල්‍යමය හෝ වෙනත් ප්‍රතිලාභ අපේක්ෂාවකින් තොරව තමන්ගේ කාලය, ශ්‍රමය, දැනුම හා කුසලතා කැපකරන පුරවැසි සහභාගීත්වය තුළින් ප්‍රජා හා ජාතික සංවර්ධනය වේගවත් කිරීම."

## 3. පසුබිම සහ කාලීන අවශ්‍යතාවය

### 3.1 ඓතිහාසික පසුබිම

ස්වේච්ඡා සේවය යනු ශ්‍රී ලංකාවේ සංස්කෘතික හා ආගමික සාරධර්ම තුළ අනාදිමත් කාලයක සිට මුල් බැස පවතින ප්‍රෞඪ උරුමයකි. මහාවංශය වැනි ඓතිහාසික මූලාශ්‍රවලට අනුව, පුරාණ යුගයේ පැවති ආගමික හා සංස්කෘතික කටයුතු සම්බන්ධ **"දායක සභාව"** සහ කෘෂිකාර්මික සහයෝගිතාව වෙනුවෙන් ක්‍රියාත්මක වූ **"වැව සභාව"** ලාංකීය ඉතිහාසයේ හමුවන පළමු ස්වේච්ඡා සංවිධාන වේ. 20 වන සියවසේ මැද භාගයේ සිට මෙම ක්ෂේත්‍රය හුදු 'පුණ්‍ය කටයුතුවලින්' ඔබ්බට ගොස් සංවර්ධනය කේන්ද්‍ර කරගත් රාජ්‍ය නොවන සංවිධාන (NGOs) සහ ප්‍රජා මූල සංවිධාන හරහා ක්‍රමයෙන් වර්ධනය විය.

ශ්‍රී ලංකාව සතුව දීර්ඝ ඉතිහාසයක් සහ ආගම තුළින් හැඩ ගැසුණු ස්වේච්ඡා සේවයක් හා ඒ මත පෝෂණය වූ සංස්කෘතියක් පවතින අතර ඒවා මානව ක්‍රියාකාරකම්වල සියළු අංශ දක්වා ප්‍රායෝගිකව විහිදේ. අතීතයේ සිට මේ දක්වා වූ සියළු වෙනස්කම් හමුවේදීත් ස්වේච්ඡා සේවය දක්වා මිනිසාගේ වූ කැමැත්ත මේ දක්වා ම නොවෙනස්ව පවතී. සියළුම ආගම්වල වත්පිළිවෙත් මගින් ස්වේච්ඡා සේවයේ යෙදීම සඳහා වූ ඉඩකඩ පුළුල් කරනු ලැබේ.

### 3.2 පවතින අභියෝග සහ කාලීන අවශ්‍යතාවය

වර්තමානයේ දේශගුණික විපර්යාස නිසා ඇතිවන ගංවතුර, නියඟ, නායයෑම්, වෙරළ ඛාදනය, ආන්තික කාලගුණික සිදුවීම් සහ ඉහළ යන උෂ්ණත්වය ඇතුළු ස්වාභාවික විපත් වල අහිතකර බලපෑම් වලට ශ්‍රී ලංකාව වැනි දූපත් වැඩි වැඩියෙන් ගොදුරු වේ. මෑත වසර වල දී, දීර්ඝ කාලීන වියළි කාලගුණය සහ වෙනස් වන වර්ෂා පතන රටා රටේ බොහෝ ප්‍රදේශවල කෘෂිකර්මාන්තය, ජල සම්පත්, ආහාර සුරක්ෂිතතාව, ජීවනෝපායන් සහ මහජන සෞඛ්‍යයට බලපා ඇත. ඍතුමය ගංවතුර සහ නායයෑම් ජීවිත හානි, ප්‍රජාව අවතැන් වීම, යටිතල පහසුකම් වලට හානි වීම සහ සැළකිය යුතු ආර්ථික හානි ඇති කර තිබේ. මෙම පාරිසරික හා දේශගුණික ආශ්‍රිත අභියෝග, ළමුන්, වැඩිහිටියන්, ආබාධ සහිත පුද්ගලයින් සහ අඩු ආදායම්ලාභී ප්‍රජාව ඇතුළු අවදානමට ලක්විය හැකි ප්‍රජාවට, අසමාන ලෙස බලපායි. එබැවින්, ප්‍රජා ඔරොත්තු දීමේ හැකියාව, ආපදා සූදානම, පාරිසරික සංරක්ෂණය සහ ආපදා ප්‍රතිචාර දැක්වීම සහ ප්‍රකෘතිමත් වීම සඳහා ස්වේච්ඡා සහභාගීත්වය ශක්තිමත් කිරීම ජීවිත ආරක්ෂා කිරීම, තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාව පුරා ප්‍රජාවගේ යහපැවැත්ම වැඩි දියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.

මෙවැනි පසුබිමක් තුළ, විශේෂයෙන් ප්‍රජාවගේ සංවර්ධනය, පශ්චාත් ආපදා කළමණාකරන ප්‍රතිසංස්කරණ කටයුතු, ආපදා සඳහා පෙර සූදානම් වීමේ සැලසුම් සහ ප්‍රජා මට්ටමින් සිදුකරන ජීවනෝපාය ක්‍රියාකාරකම් වැනි වැඩසටහන් සඳහා ප්‍රාදේශීය මට්ටමින් ප්‍රජා සේවකයෝ සැළකිය යුතු සංඛ්‍යාවක් සහභාගි වෙති. කෙසේ වෙතත්, රටතුළ ස්වේච්ඡා සේවය පිළිබඳ ඒකාබද්ධ ප්‍රතිපත්තියක්, ව්‍යුහයන් හා පද්ධති නොතිබීම හේතුවෙන් රට තුළ ස්වේච්ඡා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ද්වීකරණය වීම සිදුවිය හැක. පොදුවේ ස්වේච්ඡා අංශය සඳහා හා විශේෂයෙන් ස්වේච්ඡා සේවකයන් සඳහා ක්‍රමවත් ප්‍රවේශයක් නොමැතිවීම නිසා ඔවුන්ගේ දායකත්වය පිලිබිඹු නොවේ.

රටේ ජාතික උරුමය විසින් හිමිකර දුන් ආචාරධර්ම මත ගොඩනැගුණු ආගම, සංස්කෘතිය සහ හැසිරීම මඟින් සවිමත් වූ මානවවාදී පරමාදර්ශ සමග ආචාරධර්ම හා සදාචාරාත්මක වටිනාකම් මෙම පද්ධතිය මඟින් පවත්වාගෙන යා යුතුය. එවැනි ආචාරධර්ම පද්ධතියක්, නූතන සමාජයට අදාළ වන මානව කරුණාව, සහයෝගිතාව සහ කරුණාවෙන් පිරිපහදු කොට නඩත්තු කළයුතු අතර ගුණාත්මක ස්වේච්ඡා සේවයක් තුළින් එය සාක්ෂාත් වේ.

එබැවින්, මෙම ප්‍රතිපත්තිය මගින් ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික සංවර්ධනය සඳහා ස්වේච්ඡා සේවකයින්ගේ සම්පත් හා අවස්ථාව උපරිම කර ගැනීමටත්, සැලසුම් සහගත අරමුණු සාක්ෂාත් කර ගැනීමේ රජයේ ප්‍රයත්න සඳහා අතිරේකව දායක වීමටත් හැකියාව ලැබෙනු ඇත.

මෙම පසුබිම තුළ ශ්‍රී ලංකාව දේශගුණික විපර්යාස, ගංවතුර, නියඟ, නායයෑම් වැනි ස්වාභාවික ආපදාවලට මෙන්ම දිළිඳුකම, මත්ද්‍රව්‍ය උවදුර සහ සමාජීය අසමතුලිතතාවයන් වැනි සංකීර්ණ අභියෝග රැසකට මුහුණ දෙමින් සිටී. මෙම අභියෝග ජය ගැනීමට සහ පශ්චාත් ආපදා කළමනාකරණ කටයුතු සඳහා ස්වේච්ඡා සේවය අත්‍යාවශ්‍ය වුව ද, ක්ෂේත්‍රය තුළ පහත සඳහන් අඩුපාඩු පවතී:

- ජාතික වශයෙන් පිළිගත් ඒකාබද්ධ මාර්ගෝපදේශ, ව්‍යුහයන්, නීතිමය පද්ධති හෝ වාර්තාකරණ යාන්ත්‍රණයක් නොමැති වීම නිසා ස්වේච්ඡා සේවය බෙදී විසිරී පැවතීම.
- ස්වේච්ඡා සේවයෙන් ජාතික ආර්ථිකයට (GDP) ලැබෙන දායකත්වය ගණනය කිරීමට ක්‍රමවේදයක් නොමැති වීම.
- ස්වේච්ඡා සේවකයන් සඳහා සමාජයීය පිළිගැනීමක්, ඇගයීමක් හෝ විශ්වාසදායක ප්‍රවේශයක් නොමැති වීම.
- පාසල්/විශ්වවිද්‍යාල අධ්‍යාපනය නිමකරන තරුණ ප්‍රජාවගේ සංක්‍රාන්ති සමය සහ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ පළපුරුද්ද ඵලදායී ලෙස ස්වේච්ඡා සේවයට දායක කරගැනීමේ විධිමත් යාන්ත්‍රණයක් නොමැති වීම.

## 4. නෛතික අර්ථ දැක්වීම්

**"ස්වේච්ඡා සේවාව"** යනු: මානව සුභසිද්ධිය සහ පොදු සමාජ යහපත උදෙසා, කිසිඳු මූල්‍යමය හෝ ද්‍රව්‍යමය ප්‍රතිලාභ අපේක්ෂාවකින් තොරව, අවසන් ප්‍රතිලාභියාට කිසිදු අමතර පිරිවැයක් සිදුනොවන පරිදි ස්වකැමැත්තෙන් සිදුකරනු ලබන ක්‍රියාකාරකම් වේ.

**"ස්වේච්ඡා සේවකයා"** යනු:

- (අ) ස්වේච්ඡාවෙන් වැඩකිරීමට කැමැත්තක් දක්වන සහ මෙම ප්‍රතිපත්තියට අනුගතව ක්‍රියා කරනු ලබන ඕනෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකු;

- (ආ) අදාළ රාජ්‍ය බලධාරීන්ගේ සහ වීසා බලපත්‍ර අනුමැතියට යටත්ව ශ්‍රී ලංකාව තුළ ස්වේච්ඡාවෙන් සේවය කිරීමට කැමැත්තක් දක්වන ඕනෑම විදේශීය පුරවැසියෙකු;

**"ස්වේච්ඡා සේවයේ නියුතු/යොදවාගන්නා සංවිධාන"** යනු: ස්වේච්ඡා සේවකයන් හරහා සිය මූලික අරමුණු සාක්ෂාත් කරගන්නා, එහි අයිතිකරුවන්ට හෝ අධ්‍යක්ෂවරුන්ට මූල්‍ය ප්‍රතිලාභ (ප්‍රතිලාභ බෙදාහැරීමක්) අත්කර නොදෙන, නීත්‍යානුකූලව ලියාපදිංචි ආයතන වේ. (රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශයේ CSR ඒකක, ලාභ නොලබන ව්‍යාපාර, රාජ්‍ය නොවන සංවිධාන (NGO/INGO), ප්‍රජා මූල සංවිධාන සහ තරුණ/සුභසාධන සමිති මෙයට ඇතුළත් වේ.)

## 5. අරමුණ, විශේෂිත අරමුණු සහ අපේක්ෂිත අරමුණුවල තාර්කිකත්වය

### 5.1 අරමුණ

මෙම ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා සේවාව ශක්තිමත් කර ප්‍රවර්ධනය කිරීම සඳහා ස්වේච්ඡා සේවයට අනුග්‍රහ දක්වන, විධිමත් සහ හිතකර පරිසරයක් නිර්මාණය කිරීමයි. ඒ මඟින් පුද්ගලයින්ගේ කාලය, දැනුම හා කුසලතා ස්වේච්ඡාවෙන් සමාජයට දායක කර ගැනීම දිරිමත් කරමින් ශක්තිමත් හා සම්බන්ධීකරණය වූ ස්වේච්ඡා අංශයක් ගොඩනැංවීම මෙහි අරමුණ වේ. එසේම, එම දායකත්වය උපරිම කරමින් රටේ ආර්ථික, සමාජීය සහ දේශපාලන සංවර්ධනයට සහ ප්‍රජා යහපැවැත්ම වර්ධනය කිරීමට ස්වේච්ඡා සේවාව වැදගත් මෙවලමක් ලෙස භාවිතා කිරීම ද මෙම ප්‍රතිපත්තියේ අරමුණ වේ.

### 5.2 විශේෂිත අරමුණු

1. ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා සේවාව සඳහා වන ජාතික ප්‍රතිපත්තිමය, නීතිමය හා ආයතනික රාමුව සම්පාදනය කිරීම සහ ශක්තිමත් කිරීම.
2. ස්වේච්ඡා සේවය කාර්යක්ෂමව කළමනාකරණය, සම්බන්ධීකරණය සහ අධීක්ෂණය සඳහා මධ්‍යගත රාජ්‍ය යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
3. ජාතික ස්වේච්ඡා ආචාරධර්ම පද්ධතියක් (Code of Ethics) සහ තත්ත්ව ප්‍රමිති හඳුන්වාදීම.
4. රාජ්‍ය, පෞද්ගලික, සිවිල් සමාජ සහ සංස්ථාගත (Corporate) අංශවල ස්වේච්ඡා සහභාගීත්වය පුළුල් කිරීම.
5. ප්‍රයෝජනයට නොගත් මානව සම්පත්, විශ්‍රාමිකයන්ගේ දැනුම සහ තරුණ කුසලතා ඵලදායී ලෙස ජාතික සංවර්ධන ප්‍රමුඛතා සඳහා යොදා ගැනීම.
6. ස්වේච්ඡා සේවය පිළිබඳ පර්යේෂණ, දත්ත රැස්කිරීම, නවෝත්පාදන සහ හොඳ භාවිතා (Best Practices) ප්‍රවර්ධනය කිරීම.
7. ස්වේච්ඡා සේවකයන්ගේ අනන්‍යතාව තහවුරු කරමින් ඔවුන්ගේ දායකත්වය ජාතික මට්ටමින් ඇගයීමට හා පිළිගැනීමට ලක්කිරීමේ ක්‍රමවේද සැකසීම.

### 5.3 අපේක්ෂිත අරමුණුවල තාර්කිකත්වය

මේවන විට ශ්‍රී ලංකාවේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී විවිධ අභියෝගවලට මුහුණ දෙමින් සිටී. ඒවා අතර දිළිඳුකම පිටුදැකීම, දරුවන්ට අදාළ ගැටළු, කුසලතා සංවර්ධනය, සමාජය යළි ඒකාබද්ධ කිරීම හා සංහිඳියාව, අභියෝග රැසකට මුහුණ දෙන තරුණ ප්‍රජාව, තනි මාපිය පවුල්, කාන්තාවන් සවිබලගැන්වීම, ඒඩ්ස්, ඩෙංගු සහ ඒ හා සමාන රෝග මැඩපැවැත්වීම, දැනුම ආර්ථික දියුණුවට උපයෝගී කරගැනීම, මිනිස් ජාවාරම, මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම, ආහාර හා කෘෂිකර්ම සංවර්ධනය, තාක්ෂණයේ උපයෝගී දායකත්වය වැඩිකිරීම, සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් නැංවීම,

ජල සම්පත් කළමනාකරණය, පරිසර කළමනාකරණය හා සංවර්ධනය, නිවාස සංවර්ධනය යන අංශ ප්‍රධාන වේ. මෙම සන්දර්භය තුළ ස්වේච්ඡා සේවාවේ දායකත්වය සුවිශේෂී වේ. එකී අභියෝග ජයගැනීම සඳහා රටතුළ ස්වේච්ඡා සේවයට කැපවූ පිරිසගේ මහඟු දායකත්වයක් ලබාගත හැකිය. එම ප්‍රයෝජනයට නොගත් ශ්‍රම සම්පත ඵලදායී ලෙස යොදා ගැනීම සඳහා ක්‍රමානුකූල ප්‍රවේශයක් අනුගමනය කිරීම කාලීන අවශ්‍යතාවයකි. ඒ අනුව, ස්වේච්ඡා සේවය විධිමත්, වගකීම්සහගත සහ තිරසාර ආකාරයෙන් සංවර්ධනය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති රාමුවක් ස්ථාපිත කිරීම කාලෝචිතය.

## 6. ප්‍රතිපත්තිමය ඉලක්ක සහ ප්‍රධාන ක්ෂේත්‍ර

### 6.1 රාජ්‍ය අංශය

- සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ පළාත් පාලන ආයතන තුළ රාජ්‍ය සේවාව ශක්තිමත් කිරීම සඳහා ස්වේච්ඡා සේවකයන්ගේ දායකත්වය ලබාගැනීමට විධිමත් ක්‍රමවේද හඳුන්වාදීම.

### 6.2 පෞද්ගලික සහ සංස්ථාගත අංශය

- ආයතනික සේවකයින්ට විශේෂ අවස්ථා සහ ජාතික වැදගත්කමක් ඇති දිනවල ස්වේච්ඡා සේවාවන්හි නිරත වීමට වෘත්තීය නිවාඩු (Volunteer Leave) හෝ අවස්ථා සැලසීම.
- සංස්ථාගත සමාජ වගකීම් (CSR) අරමුදල් සහ ව්‍යාපෘති ජාතික ස්වේච්ඡා ප්‍රතිපත්ති රාමුව සමඟ ඒකාබද්ධ කිරීම.
- පෞද්ගලික අංශයේ ස්වේච්ඡා සේවයේ නිරත වන්නන්ගේ වෘත්තීය ආරක්ෂාව තහවුරු කිරීම සහ අනතුරු/ආපදා අවස්ථාවලදී වන්දි සහ සහන සැළසීමේ ක්‍රමවේද ඇති කිරීම.

### 6.3 ස්වේච්ඡා දායකත්වය ලබාගන්නා ප්‍රධාන සංවර්ධන ක්ෂේත්‍ර

- සෞඛ්‍ය හා සනීපාරක්ෂාව
- අධ්‍යාපන, තරුණ කටයුතු සහ ක්‍රීඩා
- ආපදා පෙරසූදානම, අවම කිරීම සහ කළමනාකරණය
- පරිසර සංරක්ෂණය, වනවිද්‍යාව සහ දේශගුණික විපර්යාසයන්ට මුහුණදීම
- කෘෂිකර්මය, ආහාර සුරක්ෂිතතාවය සහ ජල සම්පත් කළමනාකරණය
- සමාජ ඒකාබද්ධතාවය, සංහිඳියාව, සමාජ සේවය සහ සුභසාධනය
- තාක්ෂණික සංවර්ධනය, භාෂා හා සංඥා භාෂා පරිවර්තනය
- මත්ද්‍රව්‍ය නිවාරණය සහ ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම
- ස්වේච්ඡා සේවය මඟින්, මානව යහපැවැත්මට සැළකිය යුතු දායකත්වයක් ලබාදිය හැකි වෙනත් අංශ

### 6.4 ස්වේච්ඡා සේවය වර්ග කිරීම

- තරුණ ස්වේච්ඡා සේවකයන් - ජාතික තරුණ ප්‍රතිපත්තියේ දක්වා ඇති පරිදි වයස අවුරුදු 15-29 අතර තරුණ තරුණියන්
- විශ්‍රාමික ස්වේච්ඡා සේවකයන්- විධිමත් රැකියාවෙන් විශ්‍රාම ගත් පුද්ගලයන් ස්වේච්ඡාවෙන් සිය සේවා ලබාදීම.
- අන්තර්ජාලීය (Online) ස්වේච්ඡා සේවකයන් - නවීන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය භාවිතා කරමින් ස්වේච්ඡා සේවා සපයන තනි පුදුගලයින් හෝ කණ්ඩායම්.

- ආයතන පදනම් වූ ස්වේච්ඡා සේවකයන් - සංවිධාන හෝ ආයතන හරහා ස්වේච්ඡා සේවා සපයන තනි පුද්ගලයින් හෝ කණ්ඩායම්
- ජාත්‍යන්තර ස්වේච්ඡා සේවකයන් - ශ්‍රී ලංකාව තුළ ස්වේච්ඡා සේවා සපයන ශ්‍රී ලාංකික නොවන අය හා විදේශයන්හි ස්වේච්ඡා සේවා සපයනු ලබන ශ්‍රී ලාංකිකයන්
- ඩයස්පෝරා ස්වේච්ඡා සේවකයන්- ස්වේච්ඡා සේවා සැපයීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශගතව වෙසෙන ශ්‍රී ලාංකික පුරවැසියන් .
- ප්‍රජා මූල ස්වේච්ඡා සේවකයන් - ස්වකීය ප්‍රජාවන් තුළ අවිධිමත් (informal) ලෙස ස්වේච්ඡා ක්‍රියාකාරකම්වල යෙදෙන තනි පුද්ගලයින් හෝ කණ්ඩායම්
- ළමුන්  සහ නව යොවුන් ස්වේච්ඡා සේවකයින් - වැඩිහිටියෙකුගේ හෝ ආයතනයක මඟ පෙන්වීම යටතේ වයස අවුරුදු 18 ට අඩු ස්වේච්ඡා ක්රියාකාරකම්වල යෙදෙන ශ්‍රී ලාංකිකයන්.
- රජයේ ස්වේච්ඡා වැඩසටහන් වල යෙදෙන අය
- බාලදක්ෂ ව්‍යාපාරය, යෞවන සමාජ, ශිෂ්‍යභට බලකාය සහ රතුකුරුස සංවිධානය
- වෘත්තීය ස්වේච්ඡා සේවකයන්- විවිධ අංශවල ක්‍රියාකාරී විධිමත් රැකියාවක නියුතු වෙමින් අර්ධ කාලීනව ස්වේච්ඡාවෙන් සිය සේවා ලබාදෙන පුද්ගලයින්
- ලියාපදිංචි ස්වේච්ඡා සංවිධාන
- ත්‍රිවිධ හමුදා, පොලීසිය හා සිවිල් ආරක්ෂක බලකා සාමාජිකයන්

## 7. ජාතික ස්වේච්ඡා කටයුතු පිළිබඳ ලේකම් කාර්යාලය

ශ්‍රී ලංකාව තුළ ශක්තිමත්, විවෘත හා තිරසර ස්වේච්ඡා සේවා පද්ධතියක් ගොඩනැගීම සහ සම්බන්ධීකරණය සඳහා විෂයභාර අමාත්‍යාංශය යටතේ **"ජාතික ස්වේච්ඡා කටයුතු පිළිබඳ ලේකම් කාර්යාලය" (National Volunteering Secretariat - NVS)** පිහිටුවනු ලැබේ. මෙහි පරිපාලන සහ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා "කළමනාකරණ මණ්ඩලයක්" (Management Board) ස්ථාපිත කෙරේ.

### 7.1 කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය (ඡන්ද බලය හිමි සාමාජිකයින්)

1. **සභාපති:** විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ලේකම්වරයා විසින් නම් කරනු ලබන අතිරේක ලේකම්වරයෙක් හෝ එම තනතුරට සමාන තනතුරක් දරන නිලධරයෙක්.
2. **කළමනාකරණ මණ්ඩලයේ කැඳවුම්කරු/ලේකම්:** ජාතික ස්වේච්ඡා කටයුතු පිළිබඳ ලේකම් කාර්යාලයේ (NVS) ප්‍රධානියා.
3. විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙක් (අතිරේක ලේකම්/අධ්‍යක්ෂ).
4. පහත සඳහන් ආයතන ප්‍රධානීන් විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරීයෙකු (බැගින්):

    - මහා භාණ්ඩාගාරය (Treasury)
    - සමාජ සේවා දෙපාර්තමේන්තුව
    - ආබාධිත තැනැත්තන් සඳහා වූ මහා ලේකම් කාර්යාලය
    - වැඩිහිටි මහා ලේකම් කාර්යාලය
    - ත්‍රිවිධ හමුදාව, පොලීසිය සහ සිවිල් ආරක්ෂක බලකාය

5. පහත සඳහන් අමාත්‍යාංශවල අතිරේක ලේකම් හෝ අධ්‍යක්ෂ මට්ටමේ නියෝජිතයෙකු (බැගින්):

    - තරුණ කටයුතු අමාත්‍යාංශය
    - අධ්‍යාපන අමාත්‍යාංශය
    - සෞඛ්‍ය අමාත්‍යාංශය

- පරිසර අමාත්‍යාංශය

## 7.2 නිරීක්ෂණ සහ උපදේශක මට්ටමේ සාමාජිකයින් (ඡන්ද බලය නොමැති)

- **උපදේශක:** විෂයභාර අමාත්‍යවරයා.
- රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් හෝ ජ්‍යෙෂ්ඨ නියෝජිතයෙක්.
- ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ (Chamber of Commerce) ප්‍රධානියෙක් හෝ ජ්‍යෙෂ්ඨ නියෝජිතයෙක් .
- විෂයභාර ලේකම්වරයා විසින් ආරාධනා කරනු ලබන සිවිල් සමාජ නියෝජිතයින් දෙදෙනෙකු (02).
- එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා සංවිධානයේ (UNV) ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු.
- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු.
- තරුණ සංවිධානයක/රාජ්‍ය නොවන සංවිධානයක (NGO) හා පර්යේෂණ ආයතනයක නියෝජිතයෙකු බැගින්.

## 7.3 ස්වේච්ඡා කටයුතු පිළිබඳ ලේකම් කාර්යාලයේ සංයුතිය

ස්වේච්ඡා කටයුතු පිළිබඳ ලේකම් කාර්යාල කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා සුදුසු අධ්‍යක්ෂවරයෙකු සහ සහයක නිලධාරී මණ්ඩලයකින් සමන්විත කාර්යාලයක් ඇති කිරීම.

## 7.3 රාජ්‍ය ආයතනවල නිලධාරීන් සවේච්ඡා සේවය සඳහා නිදහස් කිරීම

අවශ්‍ය අවස්ථාවල දී රාජ්‍ය ආයතනවල නිලධාරින් ස්වේච්ඡා සේවය සඳහා නිදහස් කිරීම සිදු කෙරේ. ශ්‍රී ලංකා ස්වේච්ඡා කටයුතු පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ සේවා කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා, සේවය අවශ්‍ය හදිසි අවස්ථාවල දී, ලේකම් කාර්යාලය ස්ථාපිත කර ඇති අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල සේවය කරන සියළුම ක්ෂේත්‍ර නිලධාරීන් සහ සංශෝධිත මෙම ජාතික ප්‍රතිපත්තියේ අංක 6.3 මගින් පෙන්වා දී ඇති ස්වේච්ඡා දායකත්ව සඳහා අවධානය යොමු කළයුතු ප්‍රධාන අංශ යටතේ සේවය කරනු ලබන ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සේවය ලබාගැනීම.

කළමනාකරණ මණ්ඩලය පත් කිරීමේදී ආබාධිත පුද්ගලයින්ට සමාන අවස්ථා ලබාදීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය (Gender Balance) සහ ජනවාර්ගික සමතුලිතතාවය පවත්වා ගැනීම අනිවාර්ය වේ.

## 7.4 ජාතික ස්වෙච්ඡා කටයුතු පිළිබඳ ලේකම් කාර්යාලයේ මූලික ක්‍රියාකාරකම්

- ස්වේච්ඡා සේවා කටයුතු ලියාපදිංචි කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා නවීන ස්වේච්ඡා කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම.
- විවිධ ක්ෂේත්‍රවල දැනුම, කුසලතා සහ පළපුරුද්ද ඇති ස්වේච්ඡා සේවකයින්ගේ තොරතුරු දත්ත පද්ධතියක් පවත්වාගැනීම සහ ඔවුන් ජාතික ස්වේච්ඡා කටයුතු ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කිරීම
- සතියකට පැය 20 කට වැඩි සේවා කාලයක් ඇතුළත් වන විධිමත් ස්වේච්ඡා සේවා සඳහා ස්වේච්ඡා සේවා ගිවිසුමක් (Volunteer Agreement) නිකුත් කිරීම.
- ස්වේච්ඡා සේවකයින්ගේ ආරක්ෂාව, සුභසාධනය සහ සේවා ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ හා රෙගුලාසි සකස් කර නිකුත් කිරීම.

- නීත්‍යානුකූලව ලියාපදිංචි වී ඇති සහ ස්වේච්ඡා සේවකයින් යොදවා ගන්නා සංවිධානවල (Volunteer Involving Organizations) තොරතුරු ලේඛනයක් පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම.
- ස්වේච්ඡා කළමනාකරණ පද්ධතිය හරහා ලැබෙන අවස්ථා සඳහා ස්වේච්ඡා සේවකයන් යොමු කිරීම සහ ඔවුන්ගේ වැඩ ප්‍රගතිය අධීක්ෂණය කිරීම.
- යම් සංවිධානයක්, ව්‍යාපෘතියක් හෝ වැඩසටහනක් වෙනුවෙන් ස්වේච්ඡාවෙන් (එනම් කිසිදු මුදල් අය කිරීමකින් තොරව) වැඩ කර අවසන් කළ පුද්ගලයන්ගෙන් එම කාර්යය පිළිබඳ අදහස්, යෝජනා, සහ චෝදනා/ප්‍රශංසා (feedback) ලබා ගැනීම.
- අවසන් කළ කාර්යයන් පිළිබඳ තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කිරීම.
- ස්වේච්ඡා කටයුතු පිළිබඳ අවම දායකත්ව මට්ටම් සම්බන්ධ වාර්තා සකස් කිරීම.
- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ අනෙකුත් අදාළ ආයතන සමඟ දත්ත හුවමාරු කරගැනීම.
- අවශ්‍ය අවස්ථාවල ස්වේච්ඡා සේවය සම්බන්ධයෙන් බලධාරීන් සමඟ සම්බන්ධීකරණය කිරීම.
- පාර්ශවකරුවන් සමඟ ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික රැස්වීම් සංවිධානය කිරීම.
- රට තුළ ස්වේච්ඡා සේවය විධිමත් කිරීමට උපකාර වන ආයතන සමඟ නිරන්තර සම්බන්ධතාව පවත්වාගෙන යාම.
- ස්වේච්ඡා සේවකයන්ගේ සහභාගිත්වය භාවිතා කර රාජ්‍ය සේවා වැඩිදියුණු කිරීමට රාජ්‍ය ආයතන දිරිමත් කිරීම.
- මානව යහපැවැත්මට දායක විය හැකි වෙනත් ආයතන සහ අංශවල සහය ලබා ගැනීම.
- අවශ්‍ය අවස්ථාවල ප්‍රවීණයන්ගේ උපදේශන සේවා ලබා ගැනීම.

## 8. මෙහෙයුම් ක්‍රියාවලිය සහ මූලික ක්‍රියාකාරකම්

ජාතික ස්වේච්ඡා කටයුතු පිළිබඳ ලේකම් කාර්යාලය (NVS) විසින් පහත සඳහන් මූලික මෙහෙයුම් ක්‍රියාත්මක කරනු ලබයි:

1. **ඩිජිටල් කළමනාකරණ පද්ධතිය:** ස්වේච්ඡා සේවකයන් සහ ස්වේච්ඡා සංවිධාන (VIOs) ලියාපදිංචි කිරීම, සම්බන්ධීකරණය සහ අධීක්ෂණය සඳහා ජාතික ඩිජිටල් දත්ත පද්ධතියක් (Online Portal) පවත්වාගෙන යාම. (මෙම ලියාපදිංචිය මඟින් කිසිදු පාර්ශවයකට නෛතික අයිතිවාසිකම් හෝ බැඳීම් ඇති නොවේ.)
2. **රාජ්‍ය නිලධාරීන් අනුයුක්ත කිරීම:** හදිසි ආපදා හෝ විශේෂ අවශ්‍යතා මතු වන අවස්ථාවලදී ලේකම් කාර්යාලයේ කටයුතු සඳහා, රාජ්‍ය ආයතනවල ක්ෂේත්‍ර නිලධාරීන් නිදහස් කරගැනීම සහ සම්බන්ධීකරණය.
3. **අධ්‍යාපන විෂය මාලාව:** පාසල්, උසස් අධ්‍යාපන සහ විශ්වවිද්‍යාල විෂය නිර්දේශයන්ට ස්වේච්ඡා සේවය විධිමත්ව ඇතුළත් කිරීම සහ බාලදක්ෂ, රතු කුරුස වැනි ශිෂ්‍ය සංවිධානවල ක්‍රියාකාරකම් පුළුල් කිරීම.
4. **දත්ත හුවමාරුව හා පර්යේෂණ:** ස්වේච්ඡා සේවයේ ආර්ථික වටිනාකම ගණනය කිරීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමඟ දත්ත හුවමාරු කර ගැනීම සහ පර්යේෂණ දිරිගැන්වීම.

## 9. ස්වේච්ඡා සේවක කොන්ත්‍රාත්තුව, අයිතිවාසිකම් සහ වගකීම්

### 9.1 ස්වේච්ඡා සේවක ගිවිසුම/කොන්ත්‍රාත්තුව

සතියකට අවම වශයෙන් පැය 20කට නොඅඩු කාලයක් විධිමත් ස්වේච්ඡා සේවයක නිරත වන පුද්ගලයින් සඳහා NVS ජාතික ස්වේච්ඡා ලේකම් කාර්යාලය මගින් විධිමත් ස්වේච්ඡා සේවා කොන්ත්‍රාත්තුවක් /ගිවිසුමක් නිකුත් කරනු ලැබේ.

- මෙම කොන්ත්‍රාත්තුව මඟින් ස්ථිර පදනමින් රාජ්‍ය සේවයට බඳවා ගැනීමක් සිදු නොවන බවත්, ඒ සඳහා කිසිදු නෛතික අපේක්ෂාවක් නිර්මාණය නොවන බවත් පැහැදිලිව සඳහන් කළ යුතුය.
- මූලික ජීවන වියදම් පියවා ගැනීම සඳහා දීමනාවක් ගෙවිය හැක්කේ එම දීමනාව කොන්ත්‍රාත්තුවේ / ගිවිසුමේ පැහැදිලිව සඳහන් කර ඇත්නම් පමණි. වැටුප් ගෙවීමේදී රජය මගින් නියමිත අවම වැටුප් අනුපාතයට අනුකූලව, සේවය කළ පැය ගණන මත පදනම්ව ගෙවීම් ගණනය කරීම. රජයේ අරමුදල් භාවිත කරන්නේ නම් මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය අනිවාර්ය වේ.

### 9.2 ස්වේච්ඡා සේවකයාගේ අයිතිවාසිකම්

- ආරක්ෂිත, ගෞරවාන්විත සහ හිතකර සේවා පරිසරයක් ලැබීමට ඇති අයිතිය.
- ගිවිසුම්ගත පරිදි අදාළ වියදම් ප්‍රතිපූරණය කර ගැනීමේ අයිතිය.
- ඉටු කළ සේවය වෙනුවෙන් ජාතික මට්ටමින් පිළිගත් ලිඛිත සහතිකයක් හෝ ඇගයීමක් ලැබීමේ අයිතිය.
- කාර්යයන් ඵලදායීව කිරීමට අවශ්‍ය පුහුණුව, වෘත්තීය උපදේශනය සහ සහයෝගය ලැබීමේ අයිතිය.
- පුද්ගලික දත්ත සහ රහස්‍යභාවය ආරක්ෂා කර ගැනීමේ අයිතිය.

### 9.3 ස්වේච්ඡා සේවකයාගේ වගකීම්

- භාරගත් කාර්යයන් නියමිත කාලය තුළ වගකීමෙන්, කාර්යක්ෂමව හා වෘත්තීය ප්‍රමිතියෙන් යුතුව ඉටු කිරීම.
- NVS මඟින් මෙහෙයවන පුහුණු, රැස්වීම් සහ දිශානති (Orientation) වැඩසටහන්වලට අනිවාර්යයෙන් සහභාගී වීම.
- සමාජයේ සංස්කෘතික, ආගමික, සාම්ප්‍රදායික හා වාර්ගික විවිධත්වයට ගරු කරමින් පොදු ආචාරධර්ම පද්ධතියට අනුගත වීම.

## 10. ජාතික ස්වේච්ඡා සේවා අරමුදල

ස්වේච්ඡා සේවය ප්‍රවර්ධනය සහ මෙහෙයුම් කටයුතු සඳහා විධිමත් **"ජාතික ස්වේච්ඡා සේවා අරමුදලක්"** ස්ථාපිත කරනු ලැබේ. මෙම අරමුදලේ සියලුම ආදායම්, වියදම් සහ මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලයේ පූර්ව අනුමැතියට යටත් වන අතර රජයේ විගණනයට අනිවාර්යයෙන්ම යටත් විය යුතුය.

### 10.1 අරමුදලේ මූලාශ්‍ර

- දේශීය හා විදේශීය ප්‍රදාන, පරිත්‍යාග, ද්විපාර්ශ්වික ආධාර සහ ආයතනික අනුග්‍රහක දායකත්වයන්.
- අරමුදලට දායකත්වය ලබා දෙන පුද්ගලයන්ට සහ ආයතනවලට එහි සාමාජිකත්වය ලබා දීමේ ක්‍රමවේද.

## 10.2 අරමුදල් පරිහරණය කළ හැකි අනුමත අරමුණු

1. **මෙහෙයුම් සහ පරිපාලන පිරිවැය:** ලේකම් කාර්යාලයේ පරිපාලන සහ සම්බන්ධීකරණ වියදම් පියවා ගැනීම.
2. **වැඩසටහන් සහ සම්පත් සැපයීම:** ස්වේච්ඡා ව්‍යාපෘති සඳහා අවශ්‍ය මෙවලම්, ද්‍රව්‍ය හා උපකරණ සැපයීම.
3. **පුහුණුව සහ ධාරිතා වර්ධනය:** ස්වේච්ඡා සේවකයන් උදෙසා පුහුණු සැසි, ධාරිතා සංවර්ධන වැඩමුළු සංවිධානය කිරීම.
4. **ප්‍රජා ව්‍යාප්තිය සහ ප්‍රචාරණය:** නව සේවකයන් බඳවා ගැනීම, දැනුවත් කිරීම් සහ සන්නිවේදන කටයුතු.
5. **ප්‍රවාහනය සහ සැපයුම්:** ද්‍රව්‍ය හා සේවක ප්‍රවාහන වියදම් පියවා ගැනීම.
6. **ආරක්ෂාව සහ රක්ෂණය:** ස්වේච්ඡා සේවකයන් සඳහා රක්ෂණ ආවරණ (Insurance), ප්‍රථමාධාර සහ ආරක්ෂක උපකරණ සුරක්ෂිත කිරීම.
7. **තාක්ෂණික යටිතල පහසුකම්:** කළමනාකරණ දත්ත පද්ධති, වෙබ් අඩවි සහ සන්නිවේදන මෙවලම් සංවර්ධනය හා නඩත්තුව.

# 11. නීති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම සහ සමාලෝචනය

## 11.1 නීති සම්පාදනය

මෙම ප්‍රතිපත්තියේ විධිවිධාන නෛතිකව බලාත්මක කිරීම සහ ස්වේච්ඡා ක්ෂේත්‍රය නියාමනය කිරීම සඳහා වන පනත් පාර්ලිමේන්තුව හරහා සම්පාදනය කිරීමට රජය කටයුතු කරනු ඇත. ඊට අදාළ රෙගුලාසි විෂයභාර අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබේ.

## 11.2 ක්‍රියාත්මක කිරීම

මෙම ජාතික ප්‍රතිපත්තිය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා, අදාළ සියලුම රාජ්‍ය, පෞද්ගලික සහ සිවිල් පාර්ශවකරුවන්ගේ අදහස් සළකා බලා විෂයභාර අමාත්‍යාංශය විසින් විස්තරාත්මක "ජාතික ක්‍රියාකාරී සැලැස්මක්" (National Action Plan) සකස් කළ යුතුය.

## 11.3 අධීක්ෂණය සහ ඇගයීම

ප්‍රතිපත්තියේ ප්‍රගතිය සහ ස්වේච්ඡා ක්‍රියාකාරකම්වල ගුණාත්මකභාවය නිරන්තරයෙන් අධීක්ෂණය හා ඇගයීම ජාතික ස්වේච්ඡා කටයුතු පිළිබඳ ලේකම් කාර්යාලය (NVS) මඟින් සිදු කරනු ලබයි.

## 11.4 ප්‍රතිපත්ති සංශෝධනය

වෙනස් වන සමාජ-ආර්ථික වටපිටාවට අනුකූලව මෙම ජාතික ප්‍රතිපත්තිය **සෑම වසර තුනකට (03) වරක්** හෝ කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සුදුසු කාලසීමාවකදී විධිමත් සමාලෝචනයකට ලක් කර සංශෝධනය කළ යුතුය.